// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2352/20 - 2023 ඔක්තෝබර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2023.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම

2023 ඔක්තෝබර් 03

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ (මෙතැන් සිට "මහ බැංකු පනත" ලෙස හැඳින්වේ) 26 වැනි වගන්තියට අනුකූලව මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව දෙදහස් විසි තුන (2023) ඔක්තෝබර් මස 03 වැනි දින මෙම මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට එළඹේ.

මෙතැන් සිට පහත පරිදි එකඟවීමට හා ප්‍රකාශ කිරීමට යෙදේ ඃ

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ගිවිසුමෙහි ඃ

   (*අ*) "කොළඹ පාරිභෝගික මිල දර්ශකය" යනු ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකයයි.

   (*ආ*) "කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය" යනු අදාළ කාර්තුවේ මාස තුන සඳහා වන මාසික කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි සරල සාමාන්‍යයයි.

2. උද්ධමන ඉලක්කය පහත සඳහන් පරිදි විය යුතු ය ඃ

   ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය සියයට 5ක මට්ටමේ පවත්වා ගැනීමට ඉලක්ක කර ගත යුතු ය. මහ බැංකු පනතේ 26(5) වගන්තියේ අවශ්‍යතාවය සඳහා උද්ධමන ඉලක්කය සඳහා වන ආන්තිකය ප්‍රතිශතාංක ± 2ක් වේ.

මෙම ගිවිසුම, මෙම ගිවිසුමේ සඳහන් දින සිට බලාත්මක වේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, සහ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ගරු ජනාධිපති.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සහ මුදල්
ප්‍රතිපත්ති මණ්ඩලයේ සභාපති
සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ
අධිපති.

EOG 10 - 0035

1A - G 40443— 07 (2023/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*